වෙළුම 12 | කාණ්ඩය 02 | අගෝස්තු 2023

# පුවත් හසුන

## උක් පර්යේෂණ ආයතනය

## නව උක් ප්‍රභේද හතරක් වාණිජ වගාව සඳහා නිකුත් කෙරේ



අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා මෙහෙයුම්) තරංගනී වික්‍රමසිංහ මහත්මිය විසින් ලංකා සීනි සමාගමේ පැල්වත්ත ඒකකයේ ජ්‍යෙෂ්ඨ ශෂ්‍ය විද්‍යාඥ චන්දන මහතා වෙත නව ප්‍රභේද ලබා දෙමින්

2003 කාණ්ඩයේ උසස් ලක්ෂණ සහිත නව උක් ප්‍රභේද 04ක් වාණිජ වගාව සඳහා නිකුත් කිරීමට උක් පර්යේෂණ ආයතනය විසින් පියවර ගනී. ඒ අනුව, SL 03 336, SL 03 983, SL 03 1025 හා SL 03 1077 යන ප්‍රභේද මෙලෙස හඳුන්වා දීමට කටයුතු කර ඇත. මෙම ප්‍රභේද අතරින් SL 03 1025 හා SL 03 336 ප්‍රභේද වර්ෂාපෝෂිත හා වාරිපෝෂිත තත්ව සඳහා ද SL 03 1077 වර්ෂාපෝෂිත ප්‍රදේශ සඳහාත් SL 03 983 වාරිපෝෂිත ප්‍රදේශ සඳහාත් නිර්දේශ කර ඇත. 2023 ජූලි 27 දින උක් පර්යේෂණ ආයතනයේ දී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා මෙහෙයුම්) තරංගනී වික්‍රමසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් නව ප්‍රභේද සංකේතාත්මක ලෙස, සෙවනගල, පැල්වත්ත, ඇතිමලේ හා ගල්ඔය සීනි කර්මාන්තායතන වෙත බෙදා දීමට පියවර ගෙන ඇත.

## දේශීය උක් කර්මාන්තයේ සංවර්ධනයට බ්‍රසීලය හා ශ්‍රී ලංකාව අතර තාක්ෂණික සහයෝගීතාවක්




දේශීය උක් කර්මාන්තයේ දියුණුව උදෙසා ශ්‍රී ලංකාව සහ බ්‍රසීලය අතර තාක්ෂණික සහයෝගීතාවයක් ආරම්භ කර ඇත. බ්‍රසීල සහයෝගිතා නියෝජිතායතනයේ අනුග්‍රහය ඇතිව ද්විපාර්ශ්වික තාක්ෂණික සහයෝගීතාව, දැනුම හුවමාරු කර ගැනීම, පුහුණුව සහ ධාරිතාව සංවර්ධනය කිරීම අරමුණු කරගෙන දෙරට අතර සහයෝගීතාවය ඉදිරියට ක්‍රියාත්මක වීමට නියමිතයි.

මෙහි මූලික වැඩමුළුව 2023 ජුනි 14 දින උක් කර්මාන්තයේ ප්‍රධාන පාර්ශවකරුවන් සමගින් උක් පර්යේෂණ ආයතනයේ දී පැවැත්විණ. මේ සඳහා ලංකා සීනි සමාගමේ සෙවනගල හා පැල්වත්ත ඒකකවල වගා අංශ, කර්මාන්තශාලා හා ස්කාගාර නියෝජනය කරමින් ඒවායේ ප්‍රධාන නිලධාරීන් සහභාගී වූ අතර, ඇතිමලේ වැවිලි සමාගම හා ගල්ඔය වැවිලි සමාගමේ නිලධාරීන් මාර්ගගත ක්‍රමය ඔස්සේ මෙම වැඩමුළුවට සම්බන්ධ විය.

03 පිටුවට

### ඇතුළු පිටු


- කාලගුණික විපර්යාස හමුවේ ඇතිවිය හැකි නියං තත්වයන්ට ඔරොත්තු දීමට හැකිවන අයුරින් ජල සම්පත කළමනාකරණය කරමු 02
- දේශීය උක් කර්මාන්තයේ සංවර්ධනයට බ්‍රසීලය හා ශ්‍රී ලංකාව අතර තාක්ෂණික සහයෝගීතාවක් 03
- 2023 වර්ෂයේ ප්‍රථම අර්ධයේ උක් කර්මාන්තයේ කාර්යසාධනය 03
- නව උක් ප්‍රභේද හතරක් වාණිජ වගාවට නිකුත් කිරීම, උක් සවිය ජංගම ඇන්ඩ්‍රොයිඩ් මෘදුකාංගය එළි දැක්වීම හා ව්‍යාපාරික සබැඳිය ආරම්භ කිරීමට පැවති උත්සවයේ විශේෂ අවස්ථා 04-05
- උක් පර්යේෂණ ආයතනය විසින් හඳුන්වාදෙන නව ව්‍යාපාරික සබැඳිය (SRI-ibl) 05
- උක් වගාවේ තාක්ෂණික දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් 06
- උක් කර්මාන්තයේ ඵලදායිතාව ඉහළ නැංවීමට උක් සවිය ජංගම ඇන්ඩ්‍රොයිඩ් මෘදුකාංගය හඳුන්වා දීමට පියවර ගැනේ 07
- ශ්‍රී ලංකා උක් කර්මාන්තය: වර්තමාන තත්වය සහ අනාගත අපේක්ෂාවන් 08




බ්‍රසීල නියෝජිත කණ්ඩායම පර්යේෂණ ගොවිපොළේ නිරීක්ෂණ චාරිකාවට එක් වෙමින්

# කාලගුණික විපර්යාස හමුවේ ඇති විය හැකි නියං තත්වයන්ට ඔරොත්තු දීමට හැකිවන අයුරින් ජල සම්පත කළමනාකරණය කරමු



එල්. එම්. ජේ. ආර්. විජයවර්ධන - පර්යේෂණ නිලධාරී

ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තය ප්‍රධාන වශයෙන් පහත රට වියළි කලාපයේ සහ සුළු වශයෙන් අතරමැදි කලාපයේ ව්‍යාප්තව ඇත. කෘෂි පාරිසරික කලාප වශයෙන් ගත් කළ, සෙවනගල ප්‍රධාන වශයෙන් DL1B සහ පැල්වත්ත DL1A, DL1B සහ IL1C කලාප තුළ ව්‍යාප්ත වී ඇත. මෙම ප්‍රදේශවලට ලැබෙන වාර්ෂික වර්ෂාපතනය සහ එහි ව්‍යාප්තිය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. ඇතිමලේ කර්මාන්තායතනය ප්‍රධාන වශයෙන් DL1B කලාපයේ පිහිටා ඇත. තවද, ගල්ඔය කර්මාන්තය DL2A සහ DL2B කෘෂි පාරිසරික කලාපයන්හි ව්‍යාප්තව ඇත.

මෙම ප්‍රදේශවල සාමාන්‍ය දේශගුණික තත්වයන් යටතේ උක් වගාව ඉතා සාර්ථකව සිදු කළ හැකි අතර, දළ වශයෙන් වසර 5කට වරක් ඇති වන දැඩි නියං තත්වයන් නිසා ඇතැම් විට සැලකිය යුතු ලෙස පීඩාවට ද පත් වේ. 2016 වසරේ එවැනි නියගයක් ඇති වූ අතර, ආසන්නතම අත්දැකීම ලෙස 2023 වසරේ දී ඇතිව තිබේ. අනාගතයේ ඇතිවෙතැයි අපේක්ෂා කරන එවැනි වූ නියං තත්වයන්ට මුහුණ දීම සඳහා සැලසුම් සහගත වැඩසටහනක් දියත් කිරීම තුළින්, උක් කර්මාන්තය නියගයට සූදානම් කිරීම හා සීමිත වාරි ජල සම්පත සුරක්ෂිතව භාවිතා කිරීමේ උපායමාර්ග කෙරෙහි විශේෂයෙන් සැලකිල්ලට භාජනය කළ යුතුය. මෙහිදී තිරසාර මට්ටමේ ක්ෂණික විසඳුම් සොයා ගැනීම ඉතා අපහසු කටයුත්තක් වන අතර, බොහෝවිට මධ්‍යකාලීන හා දීර්ඝකාලීන මට්ටමේ විසඳුම් තිරසාර උපක්‍රම ලෙස හඳුන්වා දිය හැකිය.

## a). කෙටි කාලීන උපාය මාර්ග

**මූලික දැනුවත් කිරීමේ වැඩසටහන්:**

වත්මන් දේශගුණික විපර්යාස පිළිබඳව උක් ගොවීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් පුළුල් ලෙස දැනුවත් කිරීම මෙමගින් සිදු කරයි. උක් පර්යේෂණ ආයතනයේ මූලිකත්වයෙන් මෙම කාර්යය ආරම්භ කළ හැකි අතර, ක්‍රමයෙන් මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් උක් කර්මාන්තායතනයන්හි ද කාර්යභාරයක් විය යුතුය.

**ජලය අපතේ හැරීම අවම කිරීමේ වැඩසටහන්:**

ජලසම්පාදනයේ දී සිදු කරන ජලය අපතේ යාම අවම කිරීම සඳහාවන දැනුවත් කිරීම් මෙහිදී වැදගත් වන අතර, ඒ සඳහා ගොවීන්ගේ සහ අනුබද්ධ නිලධාරීන්ගේ ආකල්ප වැඩිදියුණු කිරීම ද අත්‍යවශ්‍යය. කෙසේ වෙතත්, ගොවීන් මෙම කාර්ය නිසියාකාරව සිදු කරන බවට සහතික වීම සඳහා සමීප නිරීක්ෂණයක් අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා අදාළ උක් කර්මාන්ත ආයතන හරහා කාර්ය සාධන ඒකක පිහිටුවා ගත යුතු අතර, අවශ්‍ය නායකත්වය සහ මගපෙන්වීම උක් පර්යේෂණ ආයතනයේ ව්‍යාප්ති සේවා හරහා සිදු කරනු ඇත.

**ඇළ මාර්ග පද්ධතිය හරහා සිදුවන ජලය අපතේ යාම අවම කිරීම:**

උක් වගාවට ජලය ගෙන යන වාරි ජලය බෙදා හැරීමේ ඇළ මාර්ග පද්ධතිය ඇතැම් අවස්ථාවල දී ඉතා අකාර්යක්ෂම බැවින් වාරි ජලය බෙදා හැරීමේ ක්‍රියාදාමය නිරීක්ෂණය කිරීමට පියවර ගත යුතුය. ඇළ මාර්ග පැති බැමි හරහා ජලය කාන්දු වන ස්ථාන සහ ජල පාලන උපකරණ නිසියාකාරව ක්‍රියා නොකරන ස්ථානවල තාවකාලික ප්‍රතිකර්ම හෝ ක්‍රියාත්මක කළ යුතුය. මේ ක්‍රමය අනුගමනය කිරීම මගින් අපතේ යන ජල ප්‍රමාණය අවම කර ගත හැකි අතර, අනවසරයෙන් ජලය ලබා ගැනීම ද අවම කළ හැකිය. කෙසේ වෙතත්, වාරි ඇළ මාර්ග පිළිසකර කිරීම සඳහා වියදමක් දැරීම සමස්ත කර්මාන්තයේ ප්‍රගතිය මෙන්ම ජාතික වශයෙන් ජල සම්පත සුරක්ෂිතව භාවිත කිරීමේ වගකීමේ කොටසක් වනු ඇත.

## b). මධ්‍ය කාලීන උපාය මාර්ග

මධ්‍ය කාලීන උපාය මාර්ග ප්‍රධාන දිශානති දෙකක් ඔස්සේ සිදු කළ හැකිය. එනම්,

(1) වාරි ජලය සපයන ඉඩම්වල ජල සම්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම
(2) වර්ෂාපෝෂිත ඉඩම්වල වැසි ජලය භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම

**වාරිපෝෂිත උක් වගාවන්හි ජලසම්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම:**

ශ්‍රී ලංකාවේ උක් වගාවන් ප්‍රධාන වශයෙන් මතුපිට ජල සම්පාදන ක්‍රම යටතේ පවත්වාගෙන යයි. එහිදී වඩාත් ප්‍රචලිත ක්‍රමය වන්නේ ඇලි දිගේ කෙරෙන ජල සම්පාදනයයි. මේ සම්බන්ධව සිදු කරන ලද පර්යේෂණවලට අනුව මෙම ජල සම්පාදන ක්‍රමය 40-50%ක පමණ කාර්යක්ෂමතාවක් පෙන්නුම් කර ඇත. (සැයු: ඉහළ කළමනාකරණ තත්ත්ව යටතේ වුවද මෙවැනි මතුපිට ජල සම්පාදන ක්‍රම මගින් ලබාගත හැක්කේ 60%ක පමණ කාර්යක්ෂමතාවක් බව මෙහිදී අවධාරණය කළ යුතුය).

උක් පේළි දිගේ බෑවුම සහ උක් පාත්තිවල දිග නිර්දේශයන්ට අනුකූලව සැකසීම මගින් ජලසම්පාදන කාර්යක්ෂමතාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ දමාගත හැකිය. උක් පේළි දිගේ බෑවුම 1%ක උපරිම අගයක් පවත්වාගත යුතු බවට නිර්දේශකර ඇතත්, බොහෝවිට මෙම සීමාව ඉක්මවා ඇලි වැටි සැකසීම දක්නට ලැබේ. මෙම තත්වය ජලසම්පාදන කාර්යක්ෂමතාව අඩු වීමට මෙන්ම පාංශු ඛාදනය ඉහළ යාමට ද ප්‍රධාන හේතුවයි. උක් පේළි දිගේ බෑවුමේ අගය ඉතා පහසුවෙන් සහ කාර්යක්ෂමව සකස් කිරීම සඳහා නව උපකරණයක් ද උක් පර්යේෂණ ආයතනය මගින් හඳුන්වා දී ඇති අතර, එහි භාවිතය පිළිබඳ උක් ගොවීන්ට මෙන්ම ට්‍රැක්ටර් රියදුරන් හටද අදාළ දැනුම ලබාදීම වැදගත් වේ.

ඉහත සඳහන් කළ පරිදි, ජලසම්පාදනය කරන අවස්ථාවේ දී ගොවීන් වාරි ජලය නිසියාකාරව භාවිතා කිරීමට උනන්දුවක් බොහෝ විට නොදක්වයි. මීට හේතුව ජලය සඳහා මීටර ක්‍රමයක් හෝ අකාර්යක්ෂමව ජලය භාවිතා කරන අයට දඬ ක්‍රමයක් දැනට භාවිත නොකිරීමයි. එමනිසා සාම්ප්‍රදායික ක්‍රමයට විකල්පයක් ලෙස කාර්යක්ෂම ජල සම්පාදන ක්‍රම ගොවීන්ට හඳුන්වා දිය යුතුය. මෙහිදී, පර්යේෂණ මගින් තහවුරු කරන ලද නව ක්‍රමයක් වන ඒකාන්තර පේළි ජල සැපයුම් ක්‍රමවේදය මූලික වශයෙන් භාවිතා කළ හැකිය. එමගින් දළ වශයෙන් වාරි ජලය 35-40% ක ප්‍රමාණයක් ඉතිරි කර ගත හැකිය. මෙලෙස ඉතිරිවන ජල ප්‍රමාණය ජල හිඟ ප්‍රදේශවලට යොමු කිරීමෙන් අමතර ඉඩම් ප්‍රමාණයකට සෙත සැලසෙනු ඇත. මෙම ඒකාන්තර පේළි ජල සැපයුම් ක්‍රමය, වාරිමාර්ග වලට සීමිත ප්‍රවේශයක් සහිත වාරි ඇළේ කෙලවරට වන්නට පිහිටි ඉඩම් සඳහා ප්‍රථමයෙන් හඳුන්වා දිය හැකිය. මේ හැර, ඉහළ ජල සම්පාදන කාර්යක්ෂමතාවකින් යුත් විසිරි සහ බිංදු ජලසම්පාදන තාක්ෂණයන් ජලය අපතේ යාම අවම කිරීමේ උපක්‍රම ලෙස දැක්විය හැකි වුවද ඒවා සඳහා මූලික වශයෙන් අධික පිරිවැයක් දැරීමට සිදුවේ. කෙසේ වෙතත් මෙවැනි නව ක්‍රමවේදවල ප්‍රායෝගිකතාවය පිළිබඳව තවදුරටත් අත්හදාබැලීම් කළ යුතු අතර, රටේ ආර්ථික තත්වයන් යහපත් වනවිට අදාළ තාක්ෂණයන් හඳුන්වාදීම කෙරෙහි අවධානය යොමු කළ හැකිය.

**වර්ෂා පෝෂිත උක් වගාව:**

වර්ෂා පෝෂිත වගාව සම්පූර්ණයෙන්ම පාහේ අහස් දියෙන් යැපෙන බැවින්, වැසි ජලය වඩාත් කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගත හැකි ක්‍රම අනුගමනය කළ යුතුය. මෙහිදී වැසි සමය ආරම්භ වූ වහාම පැළ සිටුවීමට උක් කර්මාන්ත ආයතන උපරිම උත්සාහයක් ගත යුතු අතර, ඒ සඳහා බිම් සකස් කිරීමේ ක්‍රියාවලිය කෙටි කාලයකින් අවසන් කොට කාර්යක්ෂම බෝග ආරම්භ කිරීමේ කාලසටහනක් ක්‍රියාවට නැංවිය යුතුය. ඉහත සඳහන් කළ පරිදි, නිවැරදි බෑවුමක් සහිත නිවැරදි දිගකින් යුත් උක් පාත්ති සකස් කිරීම මෙහිදී මගහැරි යා හැකි නිසා ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීම ද අත්‍යවශ්‍ය වේ.

07 පිටුවට

01 පිටුවෙන්

# දේශීය උක් කර්මාන්තයේ සංවර්ධනයට...

වැඩමුළුව ආරම්භයට ප්‍රථම බ්‍රසීල නියෝජිත කණ්ඩායම උක් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ ගොවිපොළෙහි නිරීක්ෂණ චාරිකාවකට ද එක්විය. අනතුරුව සියලු පාර්ශවකරුවන් සමගින් වැඩමුළුව ආරම්භ කිරීමට පියවර ගැණුනු අතර, එහිදී එක් එක් කර්මාන්තායතන මේ වන විට මුහුණ දෙමින් ඇති අභියෝග පිළිබඳව නියෝජිත කණ්ඩායම දැනුවත් කිරීමට ද පියවර ගන්නා ලදී. මෙම වැඩමුළුවෙන් පසු නියෝජිත කණ්ඩායම ලංකා සීනි සමාගමේ පැල්වත්ත ඒකකයේ අස්වනු නෙළීම, අස්වනු කර්මාන්තශාලාව වෙත ප්‍රවාහනය, අස්වනු ඇඹරීම මෙන්ම කර්මාන්තශාලාවේ සීනි නිෂ්පාදන ක්‍රියාවලිය ද නිරීක්ෂණය කළහ. අවසානයේ හඳුනාගත් අභියෝග සියල්ල සම්පිණ්ඩනය කොට කර්මාන්තය වඩාත් ලාභදායක දිශානතියකට යොමු කිරීමට අවශ්‍ය අරමුණු ගොඩ නැගීම සිදු කළ අතර, ඉදිරියේ දී එම අභියෝග ජය ගැනීම වෙනුවෙන් විද්‍යාත්මක හා තාක්ෂණික සහයෝගීතා වැඩපිළිවෙලක් බ්‍රසීල නියෝජිත කණ්ඩායම විසින් සකසා ඒ අනුව ඉදිරි වැඩසටහන ක්‍රියාත්මත කිරීමට නියමිතය.




උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ/ප්‍ර. වි. නි. විසින් බ්‍රසීල නියෝජිත කණ්ඩායම පිළිගනිමින්




ලංකා සීනි සමාගමේ නිලධාරීන්, අමාත්‍යාංශයේ නිලධාරීන් හා උක් පර්යේෂණ ආයතනයේ නිලධාරීන් වැඩමුළුවට සහභාගි වෙමින්

# 2023 වසරේ ප්‍රථම අර්ධයේ (ජනවාරි - ජූනි දක්වා) උක් කර්මාන්තයේ කාර්යසාධනය

දිනේශ් කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

2023 වර්ෂයේ ප්‍රථම භාගය අවසන් වන වනවිට උක් මෙට්‍රික් ටොන් 597,251ක් ඇඹරීමටත්, සීනි මෙට්‍රික් ටොන් 38,456ක් නිපදවීමටත් පැල්වත්ත, ගල්ඔය, සෙවනගල හා ඇතිමලේ යන සීනි කර්මාන්තායතන සමත්වී ඇත. එය 2022 වර්ෂයේ පළමු අර්ධයේ අඹරන ලද උක් ප්‍රමාණය වූ මෙට්‍රික් ටොන් 613,434 හා නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය වූ මෙට්‍රික් ටොන් 39,683 හා සසඳන කළ පිළිවෙලින් 2.6% හා 3%ක පමණ සුළු අඩු වීමකි.

වගුව ៖- 2022 හා 2023 වර්ෂවල පළමු අර්ධයේ සීනි හා එතනෝල් නිෂ්පාදනය

| කර්මාන්තශාලාව | අඹරන ලද උක් දඬු ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | | නිපදවන ලද සීනි ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | | නිපදවන ලද එතනෝල් ප්‍රමාණය (ලීටර් මිලියන) | |
|---|---|---|---|---|---|---|
| | 2022 | 2023 | 2022 | 2023 | 2022 | 2023 |
| පැල්වත්ත | 247,342 | 211,176 | 15,829 | 13,965 | 3.47 | 2.20 |
| ගල්ඔය | 205,343 | 149,014 | 14,490 | 10,121 | 3.35 | 1.73 |
| සෙවනගල | 104,520 | 111,233 | 5,114 | 5,890 | 1.30 | 1.10 |
| ඇතිමලේ | 56,229 | 125,828 | 4,250 | 8,480 | 0.83 | 0.90 |
| **එකතුව** | **613,434** | **597,251** | **39,683** | **38,456** | **8.94** | **5.94** |

මෙම නිෂ්පාදනය අඩුවීම කෙරෙහි, පැවති නියං තත්වය හේතුවෙන් උක් අස්වැන්න අඩුවීම සෘජුවම බලපා ඇත. 2023 වසරේ ප්‍රථම භාගයේ අඹරන ලද උක් ප්‍රමාණයේ අඩු වීමට සාපේක්ෂව නිපදවන ලද සීනි ප්‍රමාණය ඉහළ ප්‍රතිශතයකින් අඩුවී ඇත. එයට ප්‍රධාන වශයෙන් කර්මාන්තශාලාවල සීනි උකහා ගැනීමේ ප්‍රතිශතයෙහි අඩු වීමද බලපා ඇත.

ENA නිෂ්පාදනයෙහි ද පෙර වසරට සාපේක්ෂව 33% අඩු වීමක් දක්නට ලැබෙන අතර, ඒ සඳහා පසුගිය වසරේ අගභාගයේ සිට පැවතෙන ඉල්ලුම අඩු වීමනිසා ENA නිෂ්පාදන අලෙවිකර ගැනීමේ ගැටලුව ද දැඩිව බලපා ඇති බව පෙනේ. මෙම තත්වයන් යටතේ 2023 වසර තුළ දී දේශීය සීනි හා ENA නිෂ්පාදනය පෙර වසරට වඩා අඩු වීමක් අපේක්ෂා කළ හැකිය.

# නව උක් ප්‍රභේද හතරක් වාණිජ වගාවට නිකුත් කිරීම, උක් සවිය ඇන්ඩ්‍රොයිඩ් මෘදුකාංගය හඳුන්වාදීම හා ආයතනීය ව්‍යාපාරික සබැඳිය ආරම්භ කිරීම වෙනුවෙන් පැවති උත්සවයේ විශේෂ අවස්ථා



අතිරේක ලේකම්තුමිය විසින් පොල්තෙල් පහන දල්වමින්



උක් පර්යේෂණ ආයතනයේ සභාපතිතුමා විසින් පිළිගැනීමේ කතාව සිදු කරමින්



උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂතුමා විසින් අරමුණු පැහැදිලි කරමින්



උක් පර්යේෂණ ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරයෙකුවන ආචාර්ය අරුණ විජේසූරිය විසින් ඇතිමලේ වැවිලි සමාගමේ ශෂ්‍ය විද්‍යාඥ වෙත නව ප්‍රභේද ලබා දෙමින්

නව උක් ප්‍රභේද වාණිජ වගාවට හඳුන්වාදීමේ උත්සවය 2023 ජූලි 27 දින උක් පර්යේෂණ ආයතනීය ශ්‍රවණාගාරයේ දී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා මෙහෙයුම්) තරංගනී වික්‍රමසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය.

මෙහිදී, 2003 කාණ්ඩයේ උසස් ලක්ෂණ සහිත උක් ප්‍රභේද හතරක් වාණිජ වගාව වෙත හඳුන්වා දීමට උක් පර්යේෂණ ආයතනය කටයුතු කර ඇත. මෙම ප්‍රභේද සියලුම සීනි කර්මාන්තායතන වෙත නිල වශයෙන් හඳුන්වා දීම හා නිකුත් කිරීම ද මෙම උත්සවයේ දී සිදු විය.

එමෙන්ම, බෝග පෝෂණ අංශයේ පර්යේෂණ නිලධාරී ලහිරු කුමාරසිරි මහතා විසින් නිර්මාණය කරන ලද 'උක් සවිය' ඇන්ඩ්‍රොයිඩ් මෘදුකාංගය හා ආයතනීය ව්‍යාපාරික සබැඳිය එළි දැක්වීමත් මෙම උත්සවයේ දී සිදු කෙරිණි.

මෙම අවස්ථාව සඳහා වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය නියෝජනය කරමින් එහි අමාත්‍යාංශ කාර්ය මණ්ඩල සාමාජිකයින්, විශ්වවිද්‍යාල ආචාර්ය මහාචාර්යවරු, පර්යේෂකයන්, ජාතික නවෝත්පාදන නියෝජිතායතනයේ නිලධාරීන් මෙන්ම ලංකා සීනි සමාගමේ සෙවනගල හා පැල්වත්ත, ඇතිමලේ වැවිලි සමාගම හා ගල්ඔය වැවිලි සමාගම යන සීනි සමාගම් නියෝජනය කරමින් ඒවායේ ප්‍රධාන නිලධාරීන් හා එම කර්මාන්තායතනවලට අනුබද්ධ ගොවි නියෝජිතයින් ඇතුළු විශාල පිරිසක්ද සහභාගී විය.



උත්සවයට සහභාගි වූ සෙවනගල, පැල්වත්ත, ඇතිමලේ හා හිඟුරාන ප්‍රදේශවලින් පැමිණි ගොවි නියෝජිතයන්



උත්සවයට සහභාගි වූ සෙවනගල, පැල්වත්ත, ඇතිමලේ හා හිඟුරාන සීනි කර්මාන්තායතනවල ප්‍රධාන නිලධාරීන්



උත්සවයට සහභාගි වූ රාජ්‍ය අමාත්‍යාංශ නියෝජිතයින්, කර්මාන්තායතනවල නිලධාරීන් හා ගොවි නියෝජිතයින්

උත්සවය අවසානයේ සැකසුම් තාක්ෂණ අංශය මගින් සංවිධානය කළ උක් ආශ්‍රිත අතුරු නිෂ්පාදනයන් හා යාන්ත්‍රිකරණ තාක්ෂණ අංශය මගින් නිපදවන ලද යන්ත්‍රෝපකරණ ඇතුළත් ප්‍රදර්ශනයක් ද පැවැත්විණි. මෙහිදී අතුරු නිෂ්පාදන මිලදී ගැනීමටත්, ඉතා ප්‍රණීත උක් යුෂ වීදුරුවක රස බැලීමට අවස්ථාව උදාකර දීමටත් සංවිධායක කමිටුව පියවර ගෙන තිබුණි.



පැමිණි පිරිස සැකසුම් තාක්ෂණ අංශය මගින් සංවිධානය කළ උක් ශාකය ආශ්‍රිත අතුරු නිෂ්පාදන ඇතුළත් ප්‍රදර්ශනය නරඹමින්

## උක් පර්යේෂණ ආයතනය විසින් හඳුන්වාදෙන ව්‍යාපාරික සබැඳිය (SRI-ibl)

උක් පර්යේෂණ ආයතනය මගින් ලබාදෙන සේවාවන්හි ගුණාත්මකභාවය සහ ප්‍රායෝගික භාවිතය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා සහ වාණිජකරණය ඉලක්ක කරගත් පර්යේෂණවලට ප්‍රමුඛත්වය දීම පෙරටුකර ගනිමින් උක් පර්යේෂණ ආයතනය විසින් කර්මාන්ත සහ විවිධ වූ ව්‍යාපාර සමඟ එක්ව ආයතනයේ පර්යේෂණ වාණිජකරණය සඳහා වන ආයතනීය ව්‍යාපාරික සබැඳිය හෙවත් SRI-ibl, හඳුන්වා දීම උක් පර්යේෂණ ආයතන පාලක මණ්ඩල සාමාජික මහාචාර්ය ඩබ්ලිව්. ඒ. ජේ. එම්. ද කොස්තා අතින් සිදු විය. ජාතික නවෝත්පාදන නියෝජිතායතනයේ මගපෙන්වීම යටතේ පර්යේෂණ නිලධාරී ආචාර්ය කේ ටී ආරියවංශ ගේ පූර්ණ මැදිහත්වීමෙන් ඇරඹි, SRI-ibl, උක් පර්යේෂණ ආයතනයට අනුබද්ධ ආයතනයක් වන අතර, එය අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක වන ආයතනයේ පර්යේෂණ ප්‍රතිපල සහ නව නිපැයුම් කර්මාන්ත වෙත පහසුවෙන් ගෙනයන සහ වාණිජකරණයට යොමුකිරීම මගින් කර්මාන්තයේ සංවර්ධනය අරමුණු කරගත් නව ඒකකයක් ලෙස ක්‍රියා කරනු ඇත. නවෝත්පාදන හා නව්‍යකරණය, තාක්ෂණ හුවමාරු සහ වාණිජකරණය සඳහා මග පෙන්වන පාර්ශවකරුවන්ගේ විශ්වාසදායි පෙරටුගාමියා බවට පත්වීම දැක්ම කරගනිමින් හා නවෝත්පාදන හරහා පාර්ශ්වකරුවන් සවිබල ගැන්වීමෙන් සහ පර්යේෂණවල ප්‍රතිඵල බාධාවකින් තොරව හුවමාරු කිරීමට සහ වාණිජකරණ අවස්ථා සඳහා පහසුකම් සැලසීමෙන් ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තයේ තිරසාර වර්ධනයක් ඇති කිරීම යන මෙහෙවර ඔස්සේ SRI-ibl ක්‍රියාත්මක වීමට නියමිතය.




SRI-IBL සඳහා නිර්මාණය කළ වෙබ් පිටුව දියත් කිරීම සඳහා වන විධානය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩබ්ලිව්. ඒ. ජේ. එම්. ද කොස්තා විසින් ලබා දෙමින්

# උක් වගාවේ තාක්ෂණික දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන්



**සිසුන් උක් හකුරු නිෂ්පාදනය සම්බන්ධ ප්‍රායෝගික පුහුණුව ලබා ගනිමින්**

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ වැවිලි කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව හදාරන සිසු කණ්ඩායමක් වෙනුවෙන් උක් වගාව සම්බන්ධ ප්‍රායෝගික අධ්‍යාපනික වැඩසටහනක් 2023 මැයි 24 දින උක් පර්යේෂණ ආයතනයේ දී පැවැත්විණි. උක් වගාවේ බිම් සැකසීමේ සිට අස්වැන්න නෙළීම දක්වා වූ සියලු පාලන කටයුතු මෙන්ම ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම හා උක් ආශ්‍රිත අතුරු නිෂ්පාදන පිළිබඳව ද ලබා දෙන ලදී.



**සිසුන් උක් හකුරු හා පැණි නිෂ්පාදනය සම්බන්ධ ප්‍රායෝගික පුහුණුව ලබා ගනිමින්**

රත්මලාන යුනිවසිටි කොලේජ් සිසු කණ්ඩායමක් වෙනුවෙන් සැකසුම් තාක්ෂණය සම්බන්ධ ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් 2023 මැයි 25 දින උක් පර්යේෂණ ආයතනයේ දී පැවැත්විණි. එහිදී උක් ආශ්‍රිතව සිදු කළ හැකි උක් පැණි හා උක් හකුරු නිෂ්පාදනය පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබා දීමට පියවර ගන්නා ලද අතර, සැකසුම් තාක්ෂණ අංශය විසින් මෙම වැඩසටහන මෙහෙයවන ලදී.



කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ සිසුන් කණ්ඩායමක් වෙනුවෙන් 2023 ජුනි 13 දින ප්‍රායෝගික පුහුණු අධ්‍යාපනික වැඩසටහනක් උක් පර්යේෂණ ආයතනයේ දී පවත්වන ලදී. මෙහිදී, බිම් සැකසීම, තවාන් පාලනය, රෝග හා පළිබෝධ පාලනය, අස්වැන්න නෙළීම මෙන්ම අතුරු නිෂ්පාදනයන් පිළිබඳව දැනුම සිසුන්ට ලබා දෙන ලදී.



සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂි පීඨයේ දෙනව වසර සිසුන් කණ්ඩායමක් වෙනුවෙන් 2023 ජුනි 19 දින ප්‍රායෝගික පුහුණු අධ්‍යාපනික වැඩසටහනක් උක් පර්යේෂණ ආයතනයේ දී පවත්වන ලදී. මෙහිදී ද, බිම් සැකසීම, තවාන් පාලනය, රෝග හා පළිබෝධ පාලනය, අස්වැන්න නෙළීම මෙන්ම අතුරු නිෂ්පාදනයන් පිළිබඳව දැනුම  සිසුන්ට ලබා දීමට පියවර ගැණින.



මොණරාගල ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන්, ලංකා සීනි සමාගමේ පැල්වත්ත ඒකකයේ නිලධාරීන් පිරිසක් හා බුත්තල යුධ හමුදා කඳවුරේ නිලධාරීන් පිරිසක් වෙනුවෙන් උක් වගා තක්ෂණයන් පිළිබඳව දැනුවත් කිරීමේ ප්‍රායෝගික වැඩසටහනක් 2023 ජුනි 07 දින උක් පර්යේෂණ ආයතනයේ දී පැවැත්විණ. මෙහිදී උක් වගාවේ බිම් සැකසීමේ සිට අස්වැන්න නෙළීම දක්වා වූ සියලු පාලන කටයුතු සිදුකරන ආකාරය පිළිබඳ ප්‍රායෝගික දැනුම මෙන්ම ක්ෂේත්‍ර ආදර්ශන යොදා ගනිමින් යාන්ත්‍රිකව එම කටයුතු සිදු කරන ආකාරය පිළිබඳව වැඩිදුරටත් දැනුවත් කරන ලදී.

# උක් කර්මාන්තයේ ඵලදායිතාව ඉහළ නැංවීමට,

# 'උක් සවිය'

## ඇන්ඩ්‍රොයිඩ් මෘදුකාංගය හඳුන්වා දීමට පියවර ගනී



පර්යේෂණ නිලධාරී ලහිරු කුමාරසිරි මහතා විසින් උක් සවිය ජංගම ඇන්ඩ්‍රොයිඩ් මෘදුකාංගය පාර්ශවකරුවන් වෙත හඳුන්වා දෙමින්



උක් සවිය ජංගම ඇන්ඩ්‍රොයිඩ් මෘදුකාංගය Google Play Store වෙත ඇතුළත් කිරීම සඳහා වන විධානය අතිරේක ලේකම්තුමය විසින් ලබා දෙමින්




උක් සවිය ජංගම ඇන්ඩ්‍රොයිඩ් මෘදුකාංගය E-mail ඔස්සේ පාර්ශයකරුවන් වෙත ලබාදීම සඳහා වන විධානය ආයතනයේ අධ්‍යක්ෂ/ප්‍ර. වි. නි. විසින් ලබා දෙමින්

උක් පර්යේෂණ ආයතනයේ බෝග පෝෂණ අංශයේ පර්යේෂණ නිලධාරී ලහිරු කුමාරසිරි මහතා විසින් නිර්මාණය කරන ලද 'උක් සවිය' ඇන්ඩ්‍රොයිඩ් ජංගම මෘදුකාංගය, 2023 ජූලි 27 දින උක් පර්යේෂණ ආයතනීය ශ්‍රවණාගාරයේ දී වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා මෙහෙයුම්) තරංගනී වික්‍රමසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති උත්සවයේ දී එළි දක්වන ලදී. මෙම ඇන්ඩ්‍රොයිඩ් මෘදුකාංගය Google Play Store වෙත ඇතුළත් කිරීම සඳහා වන විධානය  ලබා දෙන ලද්දේ අතිරේක ලේකම්තුමිය විසිනි. එමෙන්ම WhatsApp ඔස්සේ මෘදුකාංගය ලබාදීමේ විධානය ආයතනයේ සභාපති, තිස්ස සුනිල් රත්වත්තේ මහතා විසින් ලබා දුන් අතර, Email හා Facebook ඔස්සේ පාර්ශවකරුවන් වෙත මෘදුකාංගය යොමු කිරීමේ විධානය ආයතනයේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය එම්. එස්. පෙරේරා විසින් ලබා දෙන ලදී.

මෙම ඇන්ඩ්‍රොයිඩ් මෘදුකාංගය ඔස්සේ දේශීය උක් කර්මාන්තයට අදාළ තොරතුරු රැසක් පහසුවෙන් ලබා ගැනීමේ හැකියාව ඇති අතර, රෝග හා පළිබෝධ පාලනයට අදාළ තොරතුරු, පොහොර නිර්දේශ හා යොදන පොහොර ප්‍රමාණයන් ගණනය කිරීම පිළිබඳ තොරතුරු මෙන්ම උක් පර්යේෂණ ආයතනය විසින් නිකුත්කරනු ලබන පුවත්පත්, සඟරා හා අත් පත්‍රිකා ද පහසුවෙන් බාගත කිරීමේ පහසුව ද සලසා ඇත. එමෙන්ම අන්තර්ජාල පහසුකම් ඇතිවිට මෙන්ම නැතිව ද මෙම මෘදුකාංගය භාවිතා කිරීමට හැකිවන ලෙස නිර්මාණය කර තිබීමත් විශේෂත්වයකි.

02 පිටුවෙන්

## කාලගුණික විපර්යාස හමුවේ ඇති විය හැකි නියං තත්වයන්ට ඔරොත්තු දීමට හැකිවන අයුරින් ජල සම්පත කළමනාකරණය කරමු

මෙලෙස නිසි ලෙස සකස් කළ උක් ඉඩමක නැවත ඉඩම් සැකසීමට සිදුවන්නේ සාමාන්‍යයෙන් වසර 4-5 කට පසුවය.  නිසි පරිදි සකස් කර ගත් ඉඩමක වැසි ජලය පසට උරා ගැනීමේ ක්‍රියාවලිය ඉතා කාර්යක්ෂම වන අතර, අධික වර්ෂා කාලවල දී පස මතුපිටින් ගලන අමතර වැසි ජලය පාංශු ඛාදනයකින් තොරව ඉඩමෙන් ඉවත් කිරීම ද සහතික කෙරේ.
පාංශු ඛාදනය වලක්වා ගැනීම දිගු කාලීනව ඉඩමේ ප්‍රයෝජ්‍යතාවය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට මෙන්ම පසේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව අඩු නොවී පවත්වා ගැනීමට ද වැදගත් වේ.  තවද, පස තුළට කාන්දුවන වැසි ජල ප්‍රමාණය ඉහළ අගයක පවත්වා ගැනීමට උපකාරී වේ. වෙනත් අයුරකින් කියන්නේ නම් උක් වගාවේ වැසි ජල පරිභෝජන කාර්යක්ෂමතාවය වැඩි කරයි. එනම් නිසි පරිදි ඉඩම සැකසීම හා පාත්ති  සැකසීම මගින් උක් වගාව අහිතකර නියං වලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නංවයි.

### b).	දිගු කාලීන උපාය මාර්ග

මෙහිදී උක් වගාවට ජලය සපයන බෙදුම් ඇළ පද්ධතිය ඇතැම්විට දිගු කලක සිට ප්‍රමාණවත් මට්ටමේ පිළිසකර කිරීම් නොමැතිව පවතින අතර, බොහෝ ස්ථානවල ඇළ පද්ධතිය නැවත ප්‍රතිස්ථාපනය කළ යුතුව ඇත. මෙය සෙවනගල සහ ගල්ඔය යන ආයතන දෙකටම පොදු තත්වයක් වන අතර, රජය මැදිහත් වී කළ යුතු ආයෝජනයකි.

මේ සඳහා සැලකිය යුතු ප්‍රාග්ධනයක් අවශ්‍ය වුවද ජාතික වශයෙන් අවසානයේ  ලැබෙන ප්‍රතිලාභය ඉමහත්ය.

මීට අමතරව, වර්ෂා ජලයෙන් නඩත්තුවන උක් වගාවන් සඳහා අතිරේක ජල සම්පාදන පහසුකම් හඳුන්වාදීමට හැකි නම් එයද ඉතා වැදගත් වේ. උක් පර්යේෂණ ආයතනය මගින් සෙවනගල උක් වගාව මුලික කොටගෙන කරන ලද අධ්‍යනයකට අනුව වසරකට අවම වශයෙන් ජල සම්පාදන වාර 3ක් ක්‍රියාත්මක කිරීම තුළින් උක් අස්වැන්න 30%කින් ඉහළ නැංවිය හැකි බව පෙන්වා දී ඇත. වැසි සමයන්හි දී පස මතුපිට අපවහනයවන ජලය එක්රැස් කිරීමට හැකි උපක්‍රම භාවිතයට ගැනීම මෙහිදී වැදගත් වේ. පැල්වත්ත හා ඇතිමලේ වැනි උක් වගා ප්‍රදේශවල පිහිටි අත්හැර දමන ලද ඉපැරණි වැව් නැවත පුනරුත්ථාපනය කිරීම ද මෙහිදී කළ හැකි ඉතා ප්‍රයෝගික වැඩ පිළිවෙලකි. මේවා එල්ලංගා පද්ධති (Tank cascade system) ලෙස පුනරුත්ථාපනය කළ යුතුය. ඒ හරහා අවට ප්‍රදේශයේ භූගත ජල මට්ටම ඉහළ දමා ගැනීමේ අමතර වාසියක් ද ලැබේ.

කෙසේ වෙතත් මෙවැනි වූ අධික පිරිවැයක් සහිත වැඩසටහන් සඳහා ජාත්‍යන්තර වශයෙන් ලබා ගත හැකි උපකාරයන් කෙරෙහි ද වැඩි අවධානය යොමු කළ යුතු අතර, ඒ සඳහා උක් පර්යේෂණ ආයතනය හරහා අමාතංශ මට්ටමින් ව්‍යාපෘති යෝජනාවලියක් ද සකස් කෙරෙමින් පවතියි.

# ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තය: වර්තමාන තත්ත්වය සහ අපේක්ෂාවන්

දිනේෂ් කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

**තේ, රබර් සහ පොල් යන ප්‍රධාන වැවිලි බෝග හා සසඳන විට උක් යනු හෙක්ටයාර් 25,000ක් පමණ ආවරණය වන පරිදි වගා කරන ඉතා කුඩා පරිමාණ වැවිලි බෝගයක් වුවද, සීනි, මධ්‍යසාර, විදුලිය, කොම්පෝස්ට් යනාදී නිෂ්පාදනවල වටිනාකම රුපියල් බිලියන 48ක් වේ. එය ආසන්න වශයෙන් 2022 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) 0.13%කි.**

1950 දශකයේ අගභාගයේ දී රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය ආරම්භ කරන ලදී. දැනට සෙවනගල, පැල්වත්ත, ගල්ඔය සහ ඇතිමලේ යන සීනි කර්මාන්තශාලා හතර ක්‍රියාත්මක වන අතර, ඒවායේ සම්පූර්ණ ඇඹරුම් ධාරිතාව දිනකට ටොන් 7,700ක් පමණ වේ. සෙවනගල සහ පැල්වත්ත සීනි සැකසුම් සංකීර්ණ රජයට අයත් ලංකා සීනි (පුද්ගලික) සමාගමට අයත් වේ. ගල්ඔය සීනි කම්හල රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ගල්ඔය වැවිලි සමාගම විසින් පවත්වාගෙන යනු ලබයි. ඇතිමලේ කර්මාන්ත ශාලාව සම්පූර්ණයෙන්ම පෞද්ගලික සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ. 2022 වර්ෂයේ දේශීය සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 78,870ක් පමණ වූ අතර, එය දේශීය සීනි පරිභෝජන අවශ්‍යතාවය වූ මෙට්‍රික් ටොන් 538,870 න් 14.6% කි. එයට අමතරව, 2022 වසර තුළ සීනි කර්මාන්ත මගින් සැලකිය යුතු විදුලිබල උත්පාදනය කිරීමක්, මධ්‍යසාර (එතනෝල්) ලීටර් මිලියන 21.6කට ආසන්න ප්‍රමාණයක්, කාබන්ඩයොක්සයිඩ් පදනම් කරගත් වියළි අයිස් මෙට්‍රික් ටොන් 900ක් සහ කොම්පෝස්ට් පොහොර මෙට්‍රික් ටොන් 5,000ක් පමණ ද නිෂ්පාදනය කර ඇත.



සීනි යනු ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ජාතික ගෙවුම් ශේෂයට සැලකිය යුතු බලපෑමක් කරන වැදගත් අංශයක් වේ. 2022 වසර සඳහා මෙරට සීනි ආනයන වියදම රුපියල් බිලියන 82ක් වූ අතර, එය රටේ මුළු ආනයන වියදමෙන් 1.4%ක් විය. තේ, රබර් හා පොල් යන ප්‍රධාන වැවිලි බෝග හා සසඳන විට උක්, හෙක්ටයාර් 25,000ක් පමණ ආවරණය වන පරිදි වගා කරන ඉතා කුඩා පරිමාණ වැවිලි බෝගයක් වුවද, සීනි, මධ්‍යසාර, විදුලිය, කොම්පෝස්ට් යනාදී නිෂ්පාදනවල වටිනාකම රුපියල් බිලියන 48ක් පමණ වේ. එය ආසන්න වශයෙන් 2022 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) 0.13%කි. එසේම උක් මෙට්‍රික් ටොන් එකකින් නිපදවන සීනි, මධ්‍යසාර සහ විදුලියේ වාණිජ වටිනාකම රුපියල් 63,000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. එපමණක් නොව, උක් කර්මාන්තය මගින් සෘජු රැකියා අවස්ථා 25,000ක් සහ වක්‍ර රැකියා අවස්ථා 75,000ක් පමණ සපයා දී ඇත.

එහි ඓතිහාසික හා ආර්ථික වැදගත්කම තිබියදීත්, ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තය, මිල අඩු ආනයනවල තරඟකාරීත්වය, නවීකරණය නොකළ යටිතල පහසුකම්, විශේෂයෙන් කාර්යක්ෂමතාව සහ තරඟකාරිත්වය වැඩි කිරීම සඳහා නවීකරණය කළ යුතු සීනි කර්මාන්තශාලා, එතනෝල් වැනි නිෂ්පාදන අලෙවිකර ගැනීමේ ගැටලු, වගා කළ හැකි ඉඩම් ලබා ගැනීමේ බාධාවන් සහ පුහුණු ශ්‍රම හිඟය වැනි අභියෝග රාශියකට මුහුණ දී ඇත. උක් කර්මාන්තයේ තිරසාරභාවය උදෙසා ඉහත අභියෝගවලට ප්‍රතිචාර වශයෙන්, රජය සහ කර්මාන්තයේ අනෙකුත් පාර්ශවකරුවන් පියවර ගනිමින් සිටින අතර, ඒවායින් සමහරක් පහත සඳහන් වේ.

**01. පර්යේෂණ, සංවර්ධනය සහ තාක්ෂණ හුවමාරුව:**

උක් පර්යේෂණ ආයතනය (SRI) මගින් මෙන්ම විවිධ උක් සීනි නිෂ්පාදනය කරන රටවල රජයන් අතර සහයෝගීතාවය මත දේශගුණික විපර්යාස, රෝග සහ පළිබෝධකයන්ට වඩා ඔරොත්තු දෙන, ඉහළ උක් සහ සීනි අස්වැන්නක් ලබා දීමට හැකියාව ඇති, උක් ප්‍රභේද ලබාදීම තවදුරටත් දියුණු කරමින් පවතී. එපමණක් නොව, උක් පර්යේෂණ ආයතනය විසින් උක් වගාවේ සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා විවිධ තාක්ෂණික ක්‍රම හඳුන්වා දී ඇත. කාර්‍යක්ෂම ජලය සහ පාංශු පෝෂක කළමනාකරණ ශිල්පීය ක්‍රම, වැඩිදියුණු කළ වාරිමාර්ග පිළිවෙත්, ඒකාබද්ධ බෝග ආරක්ෂණ ක්‍රම සහ කාබනික ගොවිතැන් ක්‍රම භාවිතය ඒ අතර ප්‍රධාන වේ. තවද, උක් ගොවීන් සහ ආයෝජකයින් සඳහා උක් පර්යේෂණ ආයතනය, සීනි කර්මාන්ත ආයතනවල සහයෝගීතා මත තාක්ෂණ හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, ඒ සඳහා නවීන සන්නිවේදන තාක්ෂණයන් මෙන්ම ජංගම දුරකථන යෙදුම් සහ පර්යේෂණ වාණිජකරණය වැනි උපාය මාර්ගද ඇතුළත් කර ඇත.

**02. විවිධාංගීකරණය සහ අගය එකතු කිරීම:**

උක් කර්මාන්තයේ ප්‍රධාන සහ අතුරු නිෂ්පාදන ගණනාවක් ඇත, එබැවින් උක් ආශ්‍රිත නිෂ්පාදන සැකසුම්කරුවන්, උක් පර්යේෂණ ආයතනයේ සහාය ඇතිව උක් සැකසීමේ දී නිෂ්පාදන විවිධාංගීකරණය සහ අගය එකතු කිරීමේ අවස්ථා ගවේෂණය කරමින් සිටී.

**03. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය:**

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය පුද්ගලික ව්‍යවසායකයන් සමඟ එක්ව වවුනියාව, කිලිනොච්චිය, හොරොව්පතාන, බිබිල සහ මඩකලපුව යන ප්‍රදේශවල නව සීනි සැකසුම් ඒකක පිහිටුවීමටත්, උක් ඇඹරුම් සහ සැකසුම් කම්හල් ඇතුළු යටිතල පහසුකම් නවීකරණය කිරීමටත් කටයුතු කරයි.

ඉහත වටිනාකම්, අභියෝග සහ පිළියම් හමුවේ ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තය වර්තමානයේ වැදගත් සන්ධිස්ථානයක පවතී. එහිදී විශේෂයෙන් ප්‍රමුඛත්වය පහත වැටීම වැනි කරුණු හේතුවෙන් අභියෝගවලට මුහුණ දී ඇති නමුත්, රටේ ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයන්නෙකු ලෙස පුනර්ජීවනය කිරීමේ හැකියාව තවමත් පවතී. ඒ සඳහා ගොවීන්, නිෂ්පාදකයන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, පර්යේෂකයන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහයෝගී උත්සාහයක් අත්‍යාවශ්‍ය වේ.

**උපදේශකත්වය**
තිස්ස සුනිල් රත්වත්ත - සභාපති
ආචාර්ය එම්. එස්. පෙරේරා - අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී

**සංස්කාරක මණ්ඩලය**
ඩී. පී. ඩබ්ලිව්. පොත්තවෙල - තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී
කේ. ඒ. දිනේශ් කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
එල්. එම්. ජේ. ආර්. විජයවර්ධන - පර්යේෂණ නිලධාරී
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරී
ඒ. එන්. එම්. බී. රසික ප්‍රභාත් - සංවර්ධන නිලධාරී

**පිටු සැකසුම හා නිර්මාණකරණය**
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරී

**ලිපි සහ තොරතුරු සැපයීමෙන් දායකත්වය**
ඩී. පී. ඩබ්ලිව් පොත්තවෙල - තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී
කේ. ඒ. දිනේශ් කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
එල්. එම්. ජේ. ආර්. විජයවර්ධන - පර්යේෂණ නිලධාරී
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරී
ඒ. එන්. එම්. බී. රසික ප්‍රභාත් - සංවර්ධන නිලධාරී

**උක් කර්මාන්තයට අදාළ ලිපි සැපයීමෙන් පුවත් හසුන ඉදිරි කලාපයන් සඳහා ඔබට දායක විය හැකි අතර, එම ලිපි ලේඛන, ඔබගේ අදහස් හා යෝජනා පහත ලිපිනයට යොමු කරන්න.**

සංස්කාරක
පුවත් හසුන
උක් පර්යේෂණ ආයතනය
උඩවලව
ඊ මේල්: puwathhasunasri@gmail.com

**විමසීම්**
අධ්‍යක්ෂ, උක් පර්යේෂණ ආයතනය, උඩවලව
දුරකථන: 047 22 33281, 047 22 33285 ෆැක්ස්: 047 22 33233
ඊ මේල්: puwathhasunasri@gmail.com
වෙබ් අඩවිය: www.sugarres.lk

Follow us on

ප්‍රකාශනය - තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය - උක් පර්යේෂණ ආයතනය